# සන්නස SANNASA

## ලියා දන්වන වග

### සාහිත්‍ය මාසයට සිතුවිල්ලක්

සැප්තැම්බර් මාසය එළැඹෙන්නෙ සාහිත්‍යය පිළිබඳ ප්‍රබෝධයක් ඇති කරමින්. පොත් පත් කියවන්නට පුරුදුව සිටින්නන් තුළ ඇතිවන ප්‍රබෝධය අන් අය අතරටත් යාන්තමින් හෝ කාන්දු කරවන්න මේ මාසය තුළදී යම් උත්සාහයක් ගැනෙන්නේ නම් එය මේ මාසයේ අරමුණ ඉටු කර ගැනීමේ ගමනේ වැදගත් පියවරක් වනු ඇත.

සමාජය ඉතා වේගයෙන් වෙනස් වෙමින් තිබුණද පොත පත කියවන්නන්ගේ සංඛ්‍යාව තවමත් විශාල ය. ඒ බව මේ මාසයේදී ප්‍රකාශයට පත් වන සහ විකිණෙන පොත් සංඛ්‍යාව පෙන්වා දෙයි. පොත් මිළට ගන්නා අයගෙන් සුලුතරයක් විලාසිතාවක් ලෙස පොත් මිලට ගන්නා බවක් පෙනුණද බහුතරය පොත් මිලට ගන්නේ කියවන්නට ඇති ඇල්ම නිසාමය. කොළඹ පොත් ප්‍රදර්ශනයට රොක් වන ජන ගංගාව අපට පෙන්වා දෙන්නේද මේ කරුණම ය. මේ ප්‍රබෝධය මේ මාසයට පමණක් සීමා වන්නට නොදී ඉදිරියට ගෙන යාම ඉතා වැදගත් ය.

**පොතක් යනු ලෝකයට ඇරුණ කවුළුවකි. ඒ විස්මිත කවුලුව තුළින් ලෝකය බලන්නට අපේ දරුවන්ද හුරු කරමු.**

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe
editor@sannasa.com.au
අසෝක සුබසිංහ Asoka Subasinghe

**සහය සංස්කරණය / Asst Editor**
අසෝක සිල්වා Asoka Silva

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by Crystal D** | Digital Agency
www.crystald.com.au

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:** Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.






## ෂ්‍යාමන් ජයසිංහ

**"අප සිටින්නේ අතිශය සංකීර්ණ ක්ෂේත්‍රයකය. එය සරළව ගැනීම, ලාමකයෙකුගේ සිරිතයි"**

මම ඇවිස්සී සිටිමි. ද්‍රෝහියෙකු හඳුනාගෙන උගේ දිග පළල මැන ගැනීමේ මාර්ගයක් ළඟදීම අපට ලැබෙනු ඇත. ඒ ඥානය අපට දානය කරනු ඇත්තේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපතිවරයා විසිනි. යම් ස්නායුවේද අධ්‍යාපන අංශයකත් ඔහු සුදුස්සෙකු නොවේද? මගේ ඉමහත් අපේක්ෂාව එයින් තවත් තර වෙයි. මේ යහපත් වෛද්‍යවරයා ඒ සම්බන්ධයෙන් සැබවින් තත්පර වෙතොත්, නොබෙල් තෑග්ගට වුවත් ඔහු සුදුස්සෙකු වනු නියති. කාට නම් එවැනි ඥානයක් අවශ්‍ය නොකරත්ද? ඉතිං, එවැන්නෙකුට නොබෙල් තෑග්ගක් ලැබීම ගැන කවුරු නම් උරණ වන්නද?

"අපි ලකුණු ක්‍රමයක් හදලා තියෙනවා" යි, වැඩ වර්ජන කිරීම මන රංජනයක් කර ගත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සභාපති වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය ලේක්හවුස් මාධ්‍යවේදියෙකුට කියා තිබේ. "රටකට ද්‍රෝහී වෙන මිනිස්සුන්ව හඳුන ගන්න ක්‍රමයක් මනෝ චිකිත්සක වෛද්‍ය ක්‍රමය තුළ තියෙනවා. ඒ ද්‍රෝහීන්ගේ ලැයිස්තුව, ඔයගොල්ලෝ පළ කරන දේවල් එක්ක අන්තර්ජාලයේ පළ කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එතකොට අපිට පුළුවන් ඔයගොල්ලෝ කරන්නේ කාගේ හරි කොන්ත්‍රාත්තුවක් කියන එක රටට පෙන්නුම් කරන්න."

### වියහැකියාවන් කිහිපයක්

දොස්තර පාදෙනිය මේ කියන්නේ රටකට ද්‍රෝහී වීමක් පිළිබඳවයි. සාමාන්‍යයෙන් ගත් විට, ද්‍රෝහියෙකු යනු රටකට ද්‍රෝහී වන්නෙකු පමණක්ම නොවේ. කණ්ඩායකමට ද්‍රෝහීවීමක්, තවත් පුද්ගලයෙකුට ද්‍රෝහීවීමක් සහ යම් ප්‍රතිපත්තියකට ද්‍රෝහීවීමක් වැනි විවිධ අවස්ථා ඒ සම්බන්ධයෙන් ගෙනහැර දැක්විය හැක. බෘටස්, තම අතිජාත මිත්‍රයා වූ ජුලියස් සීසර්ට ද්‍රෝහී වීම ලෝක ප්‍රකටය. එය නෛතික අපරාධයක් වශයෙන් ගැනෙන විට හැඳින්වෙන්නේ රාජද්‍රෝහීත්වය යනුවෙනි.

බාල ළමා කාලයේදී අප කා තුළත් එක්තරා ද්‍රෝහීත්වයක් පිළිබඳ නැම්යාවක් ඇති බව, ඊඩිපස් සංකීර්ණය නැමැති සංකල්පය තුළ කියැවෙයි. යම් සන්දර්භයක් තුළ ඔබ සහ මා තුළ පමණක් නොව, දොස්තර පාදෙනිය තුළත් මේ නැම්යාව තිබිය හැකිය. ඒ පෙළඹවීම ඇති කෙරෙන්නේ මුදල් හේතුකොටගෙන විය හැකිය. නැත්නම් මමංකාරය විය හැකිය. එසේත් නැතහොත්, යම් දෘෂ්ටිවාදයක් විය හැකිය. කොටින්ම, අපේ ජීවිත කාලය තිස්සේ මේ පිළිබඳ අභ්‍යන්තරික අරගලයක අපි නිරත වෙමු. ඉස්කෝලේ යන කාලයේ ගුරුවරෙයකුගේ හෝ විදුහල්පතිවරයෙකුගේ ප්‍රශංසාවක් ලබා ගැනීම සඳහා අප අපේ සගයෙකුව පාවා දිය හැකිය. දේශපාලනික කාර්යයක යෙදෙන වයසකදී මිනිස්සු තමන්ගේ පක්ෂ පාවා දෙති. ලංකාවේ දේශපාලන ඉතිහාසය එවැනි පාවා දීම්වලින් අනූනයි. බොහෝ විට මුදල් හෝ තානාන්තර ප්‍රදානයක් නිසා මමංකාරය කිතිකැවිය හැකිය. මේවා සහ තවත් බොහෝ සාධක නිසා පාවා දීම් සහ ද්‍රෝහීත්වයන් පිළිබඳ විවිධ අවස්ථා නිර්මාණය විය හැකිය. ඒ අනුව, රටකට ද්‍රෝහී වීම යනු, යම් මිනිස් සහජාසයක තවත් එක් දිගුවක් බව පෙනේ.

### සාමාන්‍ය ව්‍යවහාරය තුළ "ද්‍රෝහියා"

යම් කෙනෙකු, යම් කණ්ඩායමක්, යම් රටක්, යම් දෘෂ්ටිවාදයක් හෝ ඉෂ්ටාර්ථයක් පාවා දෙතැයි සැලකෙන ක්‍රියාවක නිරත වන යමෙකු හැඳින්වෙන්නේ ද්‍රෝහියෙකු වශයෙනි. එසේ වීමට නම් එම පුද්ගලයා කලින් කී කෙනාට, කණ්ඩායමට, දෘෂ්ටිවාදයට හෝ ඉලක්කයට කලක් පක්ෂපාතීව සිටි අයෙකු විය යුතු යැයි සැලකේ. හමුදා නිලධාරියෙකු ස්වකීය බුද්ධි තොරතුරු හතුරෙකුට සැපයීම ඉඳුරා රාජද්‍රෝහීත්වයක් වන්නේය. සමාජවාදියෙකුව සිටි කෙනෙකු ලිබරල් ධනවාදී මතයකට පිවිසීම තවත් ද්‍රෝහීත්වයකි. එවැනි අවස්ථාවල අප ඒ පිළිබඳ විනිශ්චයන්ට පැමිණෙන්නේ, අදාළ කණ්ඩායමේ හෝ ඉලක්කයේ ඉෂ්ටාර්ථයන්ට අනුගතවය. මේ හැම අවස්ථාවකම ද්‍රෝහියෙකු් කවුදැයි නිශ්චය කෙරෙන්නේ, ඔහු කලින් අයත්ව සිටි කණ්ඩායමේ, රටේ හෝ ඉෂ්ටාර්ථයේ අර්ථකථනය මත පදනම් වෙමිනි.

ඉහත දැක්වූ නිදර්ශනවල අර්ථකථනයන් පිළිබඳ ප්‍රශ්න තිබේ. උදාහරණයක් වශයෙන් රටකට ද්‍රෝහී වීම හෝ දෘෂ්ටිවාදයකට ද්‍රෝහී වීම පිළිබඳ ප්‍රතිපක්ෂ අර්ථකථන පුරවැසියෙකුට හෝ පාක්ෂිකයෙකුට හෝ තිබිය හැකිය. යාවත්කාලීන නිදර්ශනයක් දක්වතොත්, ආණ්ඩුවේ ප්‍රතිපත්ති දේශද්‍රෝහී ප්‍රතිපත්ති වශයෙන් සැලකීමේ නැම්යාවක් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට තිබේ. ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම්වලට පක්ෂ විය හැක්කේ දේශද්‍රොහීන්ට පමණකැයි එම සංගමය සිතයි. එහෙත් අනිත් පැත්තට, මේ ගිවිසුම්වලට